# ශ්‍රී ලංකා නාවික හමුදාව

# ලංසු කැඳවීම

## හෘද සහ උරස් සංකටක දැඩි සත්කාරක වාට්ටු සංකීර්ණය ඉදිකිරීම

## රිජ්වේ ආර්යා ළමා රෝහල කොළඹ - 08
## (නල ගත වෛද්‍ය වායු පද්ධතිය සැපයීම සහ ස්ථාපනය කිරීම)

## කොන්ත්‍රාත් අංකය : SB/179/G/32/2020

1. **රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද සහ උරස් සංකටක සත්කාර සංකීර්ණයේ නල ගත වෛද්‍ය වායු පද්ධතිය සැපයීම සහ ස්ථාපනය කිරීම** සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් තෝරා ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව වෙනුවෙන්, ශ්‍රී ලංකා නාවික හමුදා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ -01 විසින් මුද්‍රා තබන ලද ලංසු සඳහා ආරාධනා නිකුත් කෙරේ. අවිනිශ්චිතතා සහ බදු හැර ඇස්තමේන්තුගත මුදල **රුපියල් මිලියන එකසිය පනහකි (රු.මි. 150)**. නිමකිරීමේ කාලය ලිත් දින 182 කි. ඉදිකිරීම් පරිශ්‍රය කොළඹ 08, රිජ්වේ ආර්යා ළමා රෝහල පරිශ්‍රයේ පිහිටා ඇත.

2. ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටියට (NCB) අනුව ලංසු තැබීම සිදු කරනු ලැබේ.

3. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලබන ලංසුකරුවන් අසාදු ලේඛන ගත කර නොතිබිය යුතු අතර, පහත සඳහන් සුදුසුකම් හා නිපුණතා නිර්ණායක සපුරාලිය යුතුය.

   අ) ලංසුකරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) **ජීව වායු පද්ධති EM -1** ශ්‍රේණිය **(MG)** ලියාපදිංචි වී තිබිය යුතුයි.

   ආ) පසුගිය වසර පහ තුළ සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල සාමාන්‍ය වාර්ෂික පරිමාව අවම වශයෙන් **රුපියල් මිලියන 300 ක්** විය යුතුය.

   ඇ) තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ව්‍යාපෘති නිශ්චිත ණය පහසුකම් ප්‍රමාණය වෙනත් කොන්ත්‍රාත්තුමය සඳහා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කරනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර **රුපියල් මිලියන 75** ට නොඅඩු විය යුතුය.

   ඇ) පසුගිය වසර පහ තුළ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් සමාන හෝ සාපේක්ෂ ස්වභාවයකින් හා සංකීර්ණත්වයකින් යුතු ගොඩනැගිලි ව්‍යාපෘතියක් සඳහා නල ගත වෛද්‍ය වායු පද්ධතිය ඉදිකිරීමේ පළපුරුද්ද.

   ඉ ) පහත සඳහන් කාර්යය මණ්ඩලය ද කොන්ත්‍රාත්කරු සතු විය යුතුය.

   - සහයක යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබිම - අර්ධ කාලීන) - ජාතික තාක්ෂණ සහතික පාඨමාලාව (NCT) යාන්ත්‍රික හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම සහ වසර 3ක පළපුරුද්ද.

5. අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් **2021 අගෝස්තු 30** වන දින සිට **2021 සැප්තැම්බර් 22** දින දක්වා වැඩකරන දිනයන්හි **පැය 0900 -පැය 1500** දක්වා අතරතුර ජොෂ්ඨ මාණ්ඩලික නිලධාරී (ගොඩනැගිලි ඉදිකිරීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ -01 හිදී ලිඛිත අයදුම්පත්‍රයක් සහ ආපසු නොගෙවන රුපියල් 30,000.00 ක (බදු රහිත) ගාස්තුවක් ගෙවීමෙන් මිල දී ගත හැකිය. මුදල් ගෙවීම මුදලින්ම කළ යුතුවේ.

6. ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිදුර තොරතුරු පහත සඳහන් ලිපිනයන්ගෙන් ලබාගත හැකි අතර සහ ලංසු කැඳවීමේ අදාළ ලේඛන ජොෂ්ඨ මාණ්ඩලික නිලධාරී (ගොඩනැගිලි ඉදිකිරීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ -01 යන ලිපිනයෙන් **2021 අගෝස්තු 30 සිට 2021 සැප්තැම්බර් 22** දක්වා ඕනෑම වැඩ කරන දිනයක **පැය 0900 සිට පැය 1500** දක්වා මුදල් ගෙවීමකින් තොරව පරිශීලනය කල හැක.

| | |
|---|---|
| අධ්‍යක්ෂක ජෙනරාල් ඉංජිනේරු,<br>නාවික හමුදා මූලස්ථානය ,<br>තැ.පෙ 593,<br>කොළඹ 01. | දූරකථන අංක - 0117194211<br>ෆැක්ස් - 0112441456<br>විද්‍යුත් තැපැල - nhqdge@gmail.com |
| ජොෂ්ඨ මාණඩලික නිලධාරී (ගොඩනැගිලි ඉදිකිරීම්),<br>නාවික හමුදා මූලස්ථානය ,<br>තැ.පෙ 593,<br>කොළඹ 01. | දූරකථන අංක - 0117192375<br>ෆැක්ස් - 0117192373<br>විද්‍යුත් තැපැල - ssobcnhq@gmail.com |

ලංසු **2021 දෙසැම්බර් 22** දින දක්වා (ලංසු අවසන් වන දින සිට දින 91ක්) වලංගු විය යුතුය.

7. ලංසු ඇපකරය, **රුපියල් 2,250,000.00** වටිනා ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් අනුමත ආකෘතියෙන් යුක්ත එකක් වියයුතුය.

8. අදාල ලංසු ඇපකරය, ලංසු අවසාන වන දිනයේ සිට **2022 ජනවාරි 19** දින දක්වා (දින 119 ක්) වලංගු විය යුතුය.

9. මේ සම්බන්ධව පෙර ලංසු හමුවක් **2021 සැප්තැම්බර් 14** වන දින **පැය 1000**ට කොළඹ 08 රිජ්වේ ආර්යා ළමා රෝහලේ දී පැවැත්වේ.

10. ලංසු මුල් පිටපත හා දෘඩ පිටපත (Hard Copy) එකකින් (01) ඉංග්‍රීසි බසින් සම්පූර්ණ කර ලංසු භාරගන්නා අවසාන වේලාව වන **2021 සැප්තැම්බර් 23** වන දින **1400 පැයට** හෝ ඉන් පෙර ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ -01 ශ්‍රී ලංකා නාවික හමුදා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ අතින් ගෙනවිත් භාරදීම හෝ ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කළ යුතුය. ලංසු ඇසුරුම් වල පිටත ලිපි කවරයේ ප්‍රසම්පාදනයේ යොමු අංක පැහැදිලිව සටහන් කළ යුතුය.

11. නියමිත දිනට නොලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම ලංසු කැඳවීම අවසන් වූ වහාම **2021 සැප්තැම්බර් 23** දින පැය 1400 ට පැමිණීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් සිදු කරනු ලැබේ. ලංසුකරු හැර ඔහුගේ නියෝජිතයකු සහභාගි වන්නේනම් ලංසුකරුගේ අනුමැතිය ලත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. ලංසුකරු විසින් ටෙන්ඩර් විවෘත කිරීමට අවම වශයෙන් වැඩ කරන දින තුනකට පෙර ටෙන්ඩර් විවෘත කිරීම සඳහා සහභාගිවන පුද්ගලයාගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය ජොෂ්ඨ මාණ්ඩලික නිලධාරී (ගොඩනැගිලි ඉදිකිරීම්), ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස ද ලංසුකරුට උපදෙස් දෙනු ලැබේ.

12. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිල ගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනැම මිල ගණන් පතක් පිලිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරිමේ බලය සභාපති, ශ්‍රී ලංකා නාවික හමුදා ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.

13. මෙම පුවත්පත් දැන්විම ශ්‍රී ලංකා නාවික හමුදා වෙබ් අඩවිය www.navy.lk මගින්ද නිරික්ෂණය කල හැක.

**සභාපති,**
දෙපාර්ථමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ -01,